**රත්නපුර ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූනි 29 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රත්නපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂවලට අදාල මුද්දර ගාස්තු ඌන බිල්කිරීම් රු. 9,155,365 ක් සඳහා ගැලපීම් කර නොතිබුණි. | වර්ෂයට අදාල ආදායම් හා ඉකුත් වර්ෂ ගැලපීම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව දන්වමි. |
| (ආ) | ඉකුත් වර්ෂවලට අදාල උසාවි දඩ ඌන බිල්කිරීම් රු. 5,237,840 ක් සඳහා ගැලපීම් කර නොතිබුණි. | වර්ෂයට අදාල ආදායම් හා ඉකුත් වර්ෂ ගැලපීම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව දන්වමි. |
| (ඇ) | බිල්පත් ගෙවා තිබූ කර්මාන්තයක් සඳහා රු. 1,035,167 ක් ණයහිමි වෙන්කිරීම් සිදුකර තිබුණි. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව දන්වමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාල ණයහිමි වෙන්කිරීම් රු. 637,450 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාල ආදායම් වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | විගණන නිරීක්ෂණ පිළිගනිමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාල උපචිත වියදම් රු. 677,344 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව දන්වමි. |
| (ඊ) | ඉදිකිරීම් කර්මාන්තයක් සඳහා ගෙවිය යුතු හා ඒ සඳහා පළාත් සභාවෙන් ලැබිය යුතු රු. 174,600 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයට අදාල ආදායම් වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ගිණුම් විෂයයන් 06 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 12,594,657 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛන සසඳා පවතින වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීම් කළ යුතුවේ. | මෙම වෙනස දීර්ඝකාලීනව පවතින බවත්, ඉදිරියේදී නිවැරදි කරන බවත් දන්වමි. |
| (ඊ) | 2008 වර්ෂයට පෙර සිට පැවත එන එකතුව රු. 484,308 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාල විස්තරාත්මක උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | මෙම ශේෂයන් පිළිබඳ සොයා බලා ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

--------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

----------------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 2012 වර්ෂයේ සිට 2016 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල රු. 3,185,328 ක් වූ ඉකුත් තැන්පතු 37 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂය අවසන් වීමේදී ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂිකව අත්සන් කලයුතු කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | 2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය | ආයතනික කාර්යයභාරයේ නිමවුමට අදාල නිමවුම් දර්ශක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල දර්ශක හඳුනාගත යුතුවේ. | විෂයයභාර නිලධාරීන් දැනුවත් කර අඩුපාඩු මඟහරවා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 ජූලි 19 දිනැති අංක 2018/ඉ-පළාත් පාලන 01 දරන පළාත් පාලන චක්‍රලේඛය | සේවාලාභියාට අන්තර්ජාලය හරහා සේවාවන් අයදුම් කිරීමේ අවස්ථාව සලසාදීම සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීමට සභාව අපොහොසත්ව තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර සේවාලාභීන්ට අවශ්‍ය පහසුකම් ලබාදිය යුතුවේ. | තාක්ෂණික පහසුකම් මේ වනවිට ලබාගෙන ඇති බවත්, ඉදිරියේදී නිලධාරීන්ට අවශ්‍ය පුහුණු වීම් ලබාදී අදාල පහසුකම් ස්ථාපිත කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 24,058,791 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,913,203 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

--------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| බදු ආදායම | 1,822,010 | 2,034,660 | 2,047,205 | 57,844 | 1,191,240 | 1,329,515 | 1,316,043 | 69,496 |
| කුලී | 5,060,000 | 102,540 | 102,540 | - | 481,400 | 46,800 | 46,800 | - |
| බලපත්‍ර ගාස්තු | 790,200 | 1,372,023 | 1,372,023 | - | 706,650 | 634,600 | 634,600 | - |
| වෙනත් ආදායම් | 25,281,000 | 40,017,388 | 53,338,157 | 5,066,648 | 19,598,000 | 21,630,338 | 37,833,060 | 18,391,992 |
| | 32,953,210 | 43,526,611 | 56,859,925 | 5,124,492 | 21,977,290 | 23,641,253 | 39,830,503 | 18,461,488 |

#### 2.2.2 වරිපනම් හා බදු

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------- | ----------------------------- |
| සභා බල ප්‍රදේශය තුල වරිපනම් අයකර ගැනීම සඳහා දියුණු ගම් ප්‍රදේශ 06 ක් 2014 ජූනි 30 දින වනවිට හඳුනාගෙන තිබුණද, දියුණු ගම් ප්‍රදේශ වල සිතියම ප්‍රකාශයට පත්කිරීම 2019 ඔක්තෝබර් දක්වා ප්‍රමාද වී තිබීම හේතුවෙන් වරිපනම් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් රැස්කර ගැනීමට අවශ්‍ය කටයුතු නොපමාව සිදුකළ යුතුවේ. | සභා බල ප්‍රදේශයේ වරිපනම් අය කිරීම සම්බන්ධයෙන් කළ යුතු තක්සේරු කිරීම් ආරම්භ කර ඇති බව දන්වමි. |

**2.2.3 බලපත්‍ර ගාස්තු**

**පරිසර බලපත්‍ර**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන 07 ක් පරිසර බලපත්‍ර ලබා නොගැනීම හා 2019 වර්ෂයේදී බලපත්‍ර අළුත් කලයුතු ආයතන 06 ක පරිසර බලපත්‍ර අළුත්කර නොතිබීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. එම හේතුවෙන් රු. 52,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | පරිසර බලපත්‍ර ලබාගත යුතු සියළු ආයතන වෙත විධිමත්ව බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුවේ. | ඉදිරියේදී මේ සම්බන්ධයෙන් නීතිමය කටයුතු කිරීමට විෂයයභාර නිලධාරී දැනුවත් කළ බව දන්වමි. |

**2.2.4 දැන්වීම් පුවරු ආදායම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුල සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් පුවරු 12 ක් ගාස්තු නොගෙවීම නිසා ගලවා ඉවත් කර තිබුණ ද, ඊට අදාලව අයවිය යුතුව පැවති රු. 87,000 ක් අයකර ගෙන නොතිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් නියමිත කාලසීමාව තුල අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මුදල් නොගෙවූ දැන්වීම් පුවරු ගලවා දැමීමට කටයුතු කළ බව දන්වමි. |

**2.2.5 වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශය තුල පවතින විදුලි සංදේශන කුළුණු 19 කින් හා කුඩා ජල විදුලි බලාගාර 16 කින් සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු ව්‍යාපාර බදු රු. 87,000 ක් අයකර ගෙන නොතිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාල ආදායම් අයකර ගනිමින් පවතින බව දන්වමි. |

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බවට හඳුනාගෙන තිබූ උසාවි දඩ රු. 1,030,250 ක් වූ අතර, මුද්දර ගාස්තු රු. 6,361,804 ක් විය. | සභාව වෙත අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | උසාවි දඩ ආදායම් ලැබී ඇති බවත්, මුද්දර ගාස්තු උපලේඛන ලබා ගැනීමට අදාල ආයතන ලිපි මඟින් දැනුවත් කර ඇති බවත් දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 ක්‍රියාකාරී සැලැස්ම අනුව බල ප්‍රදේශයේ තරුණ ප්‍රජාව ඉලක්ක කර ගනිමින් පෞරුෂත්ව සංවර්ධන හා නායකත්ව පුහුණුව ඇතුලත් පුහුණු වැඩසටහන් 05 ක් හා ළදරු පාසල් හා ගැබිනි මව්වරුන් මූලික කරගනිමින් ප්‍රජා සංවර්ධන වැඩ සටහන් 05 ක් පැවැත්වීමට සැලසුම් කර තිබූ නමුත් එම වැඩසටහන් කිසිවක් සමාලෝචිත වර්ෂය තුල ඉටුකර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී රටේ ඇති වූ පාස්කු ප්‍රහාරය හේතුවෙන් අදාල කාර්යයන් සැලසුම් කළ පරිදි කිරීමට නොහැකි වූ බව දන්වමි. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභා බල ප්‍රදේශය තුල දිරන කසළ ටොන් 100 ක් හා නොදිරන කසළ ටොන් 15 ක් පමණ මාසිකව ජනනය වුවද, ඒවා කළමනාකරණය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති වලට අනුකූල කසළ කළමනාකරණ සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ජාතික ප්‍රතිපත්ති වලට අනුකූල කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම සකස් කර ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2018 හා 2019 වර්ෂවල ක්‍රියාකාරී සැලසුම අනුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 13 ක් පැවැත්වීමට හා කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ නමුත් එම කාර්යයන් කිසිවක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ඉටුකර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුවේ. | රටේ ඇති වූ පාස්කු ප්‍රහාරයත් සමඟ ඇති වූ ව්‍යාකූල තත්ත්වය නිසා ක්‍රියාකාරී සැලැස්මට අදාල වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව දන්වමි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2019 දෙසැම්බර් වනවිටත් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සැලැසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකිරීම සඳහා දිගුකාලීන අරමුණු මුල් කොට වැඩ සටහන් කිහිපයක් සැලසුම් කර ඇති බව දන්වමි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| | | |
|---|---|---|
| 2019 වාර්ෂික පුහුණු සැලැස්ම අනුව ක්‍රියාත්මක කල යුතුව පැවති පුහුණු වැඩසටහන් 12 කින් පුහුණු වැඩසටහන් 08 ක් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි. | නිලධාරීන් සඳහා ලබාදිය යුතු පුහුණු අවස්ථා නියමිත පරිදි ලබාදිය යුතුවේ. | වාර්ෂික සැලැස්ම අනුව ක්‍රියාත්මක කිරීමට තිබූ පුහුණු වැඩ සටහන් රටේ පැවති අස්ථාවර තත්ත්වය මත ප්‍රමාද වූ බව දන්වමි. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ පවතින අනවසර ඉදිකිරීම් හඳුනාගෙන ඒවා ඉවත් කිරීම හෝ නියමානුකූල කිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සභාව අනුගමනය කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් හඳුනාගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | සභා බල ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් මේ වනතෙක් ගැටළුකාරී තත්ත්වයන් උද්ගතව නොමැති බවත්, මහජනයා විසින් කරන ලද පැමිණිළි සඳහා කාර්මික නිලධාරී මහතාගේ නිර්දේශ මත විසඳුම් ලබා දී ඇති බවත් දන්වමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 නිෂ්ක්‍රීය වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කසළ එකතු කර තැබීම සඳහා නිවාසවලට බෙදාදීමේ අරමුණින් 2019 ඔක්තෝබර් 10 දින මිලදී ගෙන තිබුණු රු. 280,870 ක් වටිනාකමැති කසළ බඳුන් 1000 ක් 2020 ජූනි 15 වනවිටත් බෙදා නොහැර සභා පරිශ්‍රයේ තබා තිබුණි. | අදාල කසළ බඳුන් අරමුණුගත කාර්යයන් සඳහා යෙදවීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | කොවිඩ් වසංගතය හේතුවෙන් සැලසුම් කළ පරිදි කසළ බඳුන් බෙදාදීමට නොහැකි වූ බවත්, මේ වනවිට එම කටයුතු කඩිනම් කර ඇති බවත් දන්වමි. |

### 3.4.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත්කල වාහන 05 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | ලියාපදිංචි සහතික සම්පූර්ණ කරගෙන හැකි ඉක්මනින් පවරා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 3.5 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නව සභාව පිහිටුවා වසරක් පිරීම නිමිත්තෙන් ක්‍රියාත්මක කර තිබූ ද්‍රව්‍යාධාර හා උපකරණ බෙදාදීමේ වැඩසටහනට ඇතුලත් රු. 2,724,115 ක් වටිනා නිවාස ආධාර හා වැසිකිළි ආධාර ලබාදීම සිදුකර නොතිබුණි. සභා අරමුදලින් රු. 796,432 ක් වැයකර මිල ගණන් කැඳවීමකින් තොරව මිලදීගෙන තිබූ වාතේ කබඩ් 45 ක සභාපතිවරයාගේ පරිත්‍යාගයක් බවට ස්ටිකරයක් අලවා තිබූ අතර, එම ස්ටිකරය සඳහා ද සභා අරමුදලින් රු. 3,670 ක් වැයකර තිබුණි. එමෙන්ම ආණ්ඩුකාරවර අනුමැතියට පටහැනිව රු. 73,080 ක් වැයකර ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා උපකරණ ද බෙදා දී තිබුණි. | ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසාගෙන වැඩසටහන් ක්‍රියාත්මක කල යුතු අතර, මිලදී ගැනීම් හැමවිටම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව සිදුකල යුතුවේ. පොදු අරමුදලින් කරන පරිත්‍යාග පෞද්ගලික පරිත්‍යාග ලෙස හුවාදැක්වීම උචිත නැත. | රත්නපුර ප්‍රාදේශීය සභාවේ වසරක අභිමන් සැමරීමේ උත්සවය සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත අදාල කටයුතු සිදුකල බවත්, සභාපතිවරයාගේ නියෝගය පරිදි කබඩ් සඳහා ස්ටිකර් ගැසීම සිදුකල බවත් දන්වමි. |

**3.6 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාපතිවරයා විසින් රාජකාරී සඳහා යොදාගෙන තිබියදී 2014 වර්ෂයේදී අනතුරට ලක්ව තිබුණු කැබ් රථය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව පරීක්ෂණ සිදුකර නොතිබුණි. තවද, අනතුර සම්බන්ධයෙන් රක්ෂණ වන්දි ඉල්ලීම නියමිත කාලසීමාව තුල ඉදිරිපත් නොකිරීම හේතුවෙන් හිමිකම් ප්‍රතික්ෂේප වී තිබූ අතර, කැබ් රථය අළුත්වැඩියාව සඳහා රු. 261,850 ක් සභා අරමුදලින් ගෙවීම් කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2014 වර්ෂයේදී සිදු වූ මෙම අනතුර සම්බන්ධයෙන් එවකට විෂයයභාර නිලධාරීන් කටයුතු නොකළේ ඇයිද යන්න සොයා බැලීමටත් සිදුව ඇති අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමටත් කටයුතු කරන බව දන්වමි. |

**3.7 ප්‍රසම්පාදනය**

**3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු නමුත් රු. 10,640,268 ක් වටිනා ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | මහජන අවශ්‍යතා කඩිනමින් ඉටු කිරීම සඳහා අත්‍යාවශ්‍ය සියළුම මිලදී ගැනීම් මිල කමිටුවේ අනුමැතිය හා සභා තීරණ මත සිදුකල බවත් 2020 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇති බවත් දන්වමි. |

**3.7.2 සැපයීම් හා සේවා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3(4)(3)(ඇ) ට පටහැනිව මිල ගණන් කැඳවීමකින් තොරව රු. 128,655 ක් වැයකර ලී බඩු හා උපකරණ මිලදී ගෙන තිබුණි. | වැඩ, භාණ්ඩ හා සේවා සපයා ගැනීමේදී හැමවිටම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවේ. | සභාපතිවරයාගේ නියෝගය මත මෙම මිලදී ගැනීම කඩිනමින් සිදු කරන ලද බවත්, හොඳ තත්ත්වයේ හා දිගුකල් පැවත්මක් ඇති භාණ්ඩ පිළිබඳව අවධානය යොමු කර ඒ සඳහා සුදුසු පෞද්ගලික ආයතනයක් කමිටුව විසින් යෝජනා කර තිබූ බැවින් එම ආයතනයෙන් මිලදී ගැනීම සිදු කල බවත් දන්වමි. |

### 3.7.3 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත 14 කට අදාලව එකතුව රු. 162,723 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගත යුතුවේ. | වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |